# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 428/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 11/03/2024 පැය 1135

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර.**

2024.03.10 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඕමන්ත පොලිස් වසමේ කොන්දකාරන්කුලම් ප්‍රදේශයේ වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඕමන්ත පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුවු **58** ක් වූ ඕමන්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ඕමන්ත පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. නීති විරෝධි මත්පැන් පෙරීමට උපයෝගී කර ගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර**

2024.03.10 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වාකරේ පොලිස් වසමේ සෝලච්චේන ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර නීති විරෝධි මත්පැන් පෙරීමට උපයෝගී කරගන්නා ගෝඩා ලීටර් 140 ක් අඩංගු බැරල් 01 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාකරේ පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ පනිච්චන්කේනි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වාකරේ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. තීරු බදු නොගෙවා මෙරටට ගෙන්වන ලද වල් නාශක සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නුවරඑළිය කඳවුර**

2024.03.10 වන දින උදෑසන  කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා නුවරඑළිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නුවරඑළිය පොලිස් වසමේ පරණ කඩ විදීය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර තීරු බදු නොගෙවා මෙරටට ගෙන්වන ලද වල් නාශක පැකට් 200 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන  නුවරඑළිය පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වූ වට්ටපක්කරුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** නුවරඑළිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**